# කොක්එබේ විහාරාම සංකීර්ණය හා එහි පුරාවිද්‍යාත්මක වැදගත්කම

කේ.එම්.යූ.කේ. ජයසේකර[69]

---

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ව මෙය පිහිටා ඇත. කහටගස්දිගිලිය නගරයේ සිට දෙමටවැව මාර්ගයේ සැතපුම් 10 ක් පමණ ගිය තැන කොක්එබේ හංදිය හමු වේ. එතැනින් උතුරු දිශාවට 1 1/2 කි.මී ගිය තැන කොක්එබේ පුරාවිද්‍යා භූමිය හමු වේ. අක්කර 3 ක් පමණ පැතිර පවතී. මෙම ක්ෂේත්‍රය පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ගොඩනැගිලි සමූහයකින් යුක්ත වේ. මහින්දාගමනයත් සමග මෙ රට ඇති වූ ආගමික ව්‍යාප්තියත් සමග ගොඩනැගුන එක් බෞද්ධ සිද්ධස්ථානයක් ලෙස කොක්එබේ විහාරාරාම සංකීර්ණය හැදින්විය හැකිය. මෙම ස්ථානයේ ආසනඝරයේ දිග අඩි 9ක් පමණ වේ. එහි පැරණි ස්තූපයක නටඹුන් දක්නට ඇත. නිධන් හොරුන් විසින් හාරා විනාශකර ඇති මෙම දාගැබේ ගඩොල් තැන තැන විසිරී ඇත. එයට අමතර ව ගඩොල් ගොඩනැගිලි කිහිපයක් මෙම ස්ථානයේ දක්නට ඇත. ස්වාභාවික ගල් පර්වතයක් මත ගල් පාදමක් සහිත තවත් ගොඩනැගිල්ලක් දක්නට ඇත. මෙම ස්ථානයේ දක්නට ඇති කොරවක්ගල් සඳකඩපහන් සරල බවින් යුක්ත ය. කළු ගල් සියුම් ව හැඩගන්වා ඇත. එසේ ම ගඩොල් උපයෝගි කර ගෙන නිර්මාණය කරන ලද කොරවක්ගල් ද ස්තූපයට පිවිසෙන ස්ථානයේ දැක ගත හැකි ය. කටාර කෙටූ ගල් ලෙන් කිහිපයක් ද මෙහි දැකගත හැකි වේ. එක් ගල් ගුහාවක කටාරයට පහලින් වන බ්‍රාහ්මී ලිපියක් දක්නට ලැබේ. පර්වතයෙහි ද සෙල්ලිපි 2ක් දක්නට ඇත. විශාල පොකුණක් මෙන් ම කුඩා පොකුණු කිහිපයක් මේ ආශ්‍රිත ව දක්නට ලැබේ. මෙම ස්ථානයට මදක් නුදුරින් පිහිටි කොක්එබේ කන්ද ආසන්නයේ සිදු කළ කැනීම් වල දී අඩි 3 ක් පමණ උස කැඩී බිඳී ගිය ගලින් කළ බුදු පිළිමයක් හමු වි ඇත. එය අනුරාධපුර කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත. එම පිළිමය හමු වූ ස්ථානය බුදු ලන්ද ලෙස ගැමියෝ හදුන්වති. මෙහි හිස සොයා ගැනිමට පුරා විද්‍යාඥයෝ උත්සහ කළ ද එය හමු වි නැත. ඒ අනුව අනුරාධපුර පර්යන්තයේ පිහිටි මෙම බෞද්ධ සංඝාරාමය ප්‍රාථමික ශෛලියෙන් වාස්තුවිද්‍යා ලක්ෂණ පෙන්වන ස්ථානයක් බව පෙන්වාදිය හැකි ය.

ප්‍රමුඛ පදඃ නටඹුන්, පුරාණ පන්සල,ගල් ලෙන්

---

[69] පුරාවිද්‍යා හා උරුමකළමනාකරණය අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, umayangakumari29@gmail.com